විසඳුම් සඳහාවන මාර්ගයක් ලෙස මානව හිමිකම්

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් වෙල්කර් ටුක් මහතාගේ කතාව

කොළඹ, ශ්‍රී ලංකාව, 2025 ජූනි 24

රජයේ පාර්ශවය නියෝජනය කරමින් පැමිණි සම්භාවනීය අමාත්‍යතුමනි,

ගෞරවනීය රාජ්‍ය තාන්ත්‍රිකයිනි ,

පාර්ශවකරුවනි, සහෘදයනි,

මිත්‍රවරුනි,

ආයුබෝවන්. වණක්කම්. අස්සලාමු-අලෙකුම්. පෙරහැසත් ජන සංස්කෘතියක්, විවිධ භාෂාසහ ආගමික සම්ප්‍රදායන්වලින් අනූන, අනාගතය සඳහාවන බලාපොරොත්තු දල්වාසිටින මේ සුන්දර, හරිත වර්ණ දිවයිනේ රැඳෙන්නට ලැබීම පිළිබඳව මම ඉමහත් සතුටට පත්වෙමි.

අපගේ මෙම හමුවීම සිදුවෙන්නේ, මේ රටටත් ලෝකයටත් ඉතාමත් නීරණාත්මක මොහොතකදී ය.

බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් සහ නීතියට අවනත වීම ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යයන් දැඩි ලෙස අපොහොසත් වීම හේතුවෙන්, ජාත්‍යන්තර නීතියේ විශ්වාසනීයත්වය බරපතල ලෙස අඩපණ වී තිබේ.

එහි සෘජු ප්‍රතිඵලයක් ලෙස, ගාසා, යුක්‍රේනයේ, සුඩානයේ, මියන්මාරයේ සහ මට ලඟින්ම්තුගත කළ හැකි තවත් බොහෝරටවල සිවිල් වැසියන්ගේ බිහිසුණු, වළක්වා ගත හැකි දුක් වේදනා, පරම්පරාගණනාවක් පුරාදෝංකර දෙන ගැඹුරු හානියක් සිදු කරමින් පවතී.

ශතවර්ෂ ගණනාවක මනුෂ්‍ය අත්දැකීම් අපට අනතුරු අඟවන්නේ, නිසි නීති රීති නොතිබීම හේතුවෙන් ප්‍රචණ්ඩත්වය සහ විනාශය පාලනයකින් තොරව

උත්සන්න වනු ඇති බවයි. බලවත් පිරිස තම අවශ්‍යතාසපුරාලීම සඳහාමානව හිමිකම්වලට ගරු නොකරමින් කටයුතු කරන අතර, එමගින් දුර්වලයන් පීඩාවට පත්වෙති.

සෑම මනුෂ්‍යයෙක් සතුවම පවතින සමානාත්මතාවය සහ අයිතිවාසිකම් මත පදනම් වූ යුක්තිය - අපව අසීමිත බලයෙන්, වරප්‍රසාදවලින්, සූරාකෑමෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාකරයි.

නැතහොත්, මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශනය පවසන පරිදි: “ලෝකයේ නිදහස, යුක්තිය සහ සාමය යන මේවායේ පදනම මිනිස් පවුලේ සියලු දෙනාගේම සහජ ගරුත්වය හා අන්සතු කළ නොහැකි වූ සම අයිතිවාසිකම් පිළිගැනීම වේ.”

ඒ පෘථිවිලි, විශිෂ්ට වාක්‍යය ගම්බුරු ප්‍රඥාවකට මග පාදන අතර ලෝකයේ අධ්‍යාත්මික සහ ඇදහිලි සම්ප්‍රදායන් ද කැඩි කරයි.

මානව හිමිකම් , යුද්ධය, දුක්ඛිතභාවය, පීඩාව සහ ප්‍රචණ්ඩත්වය යන කටුක අත්දැකීම්වලින් අපව ආරක්ෂාකරන මාර්ගයේ පදනම වන්නේ ය. මනුෂ්‍යයන්ට සාමයෙන් සහ නිදහසේ ජීවත් විය හැකි, සාමකාමී සහ සාධාරණ සමාජයක් ගොඩනැඟීමේ මඟින මානව හිමිකම් හරහාවිවාන වෙයි. ඇන්න වශයෙන්ම, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය "විශාල නිදහසක්" ගැන කතාකරයි.

අපමණ දුක් විඳි ඇති මෙරටට සාමය කෙතරම් වටිනවාද? එය පවත්වාගැනීමේ අවශ්‍යතාවය මානවින් පෘථිවිලිය.

සම්භාවනීය අමුත්තනි,

යහපත් නීතිය, නිරසර සමෘද්ධිය සහ නිරසර සාමයේ පදනම වන විශ්වීය සාධර්ම වෙනුවෙන් ලෙඩ පුරා, සියලුම රාජ්‍යයන් සහ එහි ජනතාව එකට එක්ව පෙනී සිටිය යුතු කාලය එළඹ තිබේ.

සියලු මනුෂ්‍යයන් නිදහස්ව උපත ලබන අතර අයිතිවාසිකම් හා ගෞරවයෙන් සමාන වේ. මෙය මානව හිමිකම්හි රැඩිකල්වාදී අභිලාෂයයි.

ගෘහයේ සිටින සෑම දරුවෙකුටම පවතින සමාන අයිතිවාසිකම්, ඊශ්‍රායලයේ සිටින සෑම දරුවෙකුටම ඇත.

එසේම, එම අයිතිවාසිකම් සියල්ලම ශ්‍රී ලංකාවේ සෑම පුද්ගලයෙකුටම, මෙන්ම සෑම ප්‍රජාවකටත් හිමි වේ.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, සාමකාමී රැස්වීම සහ නීරණ ගැනීමේදී සහභාගී වීමේ අයිතිවාසිකම ද ඊට ඇතුළත් වේ. වෙනස් කොට සලකීමෙන් හෝ වධහිංසාපමුණුවීම හෝ්නර්ජනයෙන් නිදහස් වීමට ඇති අයිතිවාසිකම ද ඊට ඇතුළත් වේ. යුක්තිය සඳහා ඇති අයිතිය, සිදු කරන ලද හානි සඳහා සුදුසු වගවීම, ප්‍රමාණවත් ආහාර, සෞඛ්‍ය සේවා සහ නිවාස සහ වාසස්ථාන සඳහා වන අයිතිවාසිකම් - සහ මානව අභිමානය සඳහා මූලික වන තවත් බොහෝ අත්‍යවශ්‍ය ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් ද මීට අයත් වේ.

මෙම අයිතිවාසිකම් මනුෂ්‍යයෙකු ලෙස අප සතු විය යුතු මූලික අයිතිවාසිකම් වන අතර, මර්දනයෙන් සහ පීඩනයකින් තොර ප්‍රචණ්ඩත්වයෙන් අප ආරක්ෂා කරන අත්‍යවශ්‍ය අංගයන්ද වේ.

එබැවින් ලෙඩපුරාගැටුම් වර්ධනය වෙමින්, ව්‍යසනකාරී තත්ත්වයන් ඉහළ යන පසුබිමක, ඉහත අයිතිවාසිකම් සහ ඒවායින් උපයෝගී ජාත්‍යන්තර නීතිය දැඩිව සහ ස්ථීර ලෙස ආරක්ෂාකරන මෙන් මම නිරන්තරයෙන් සියලු රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටිමි. අයිතිවාසිකම් සහ නීතිය එක්ව පවතියි.

ගෞරවනීය අමුත්තනි,

අප ජීවත්වන සංකීර්ණ හාප්‍රචණ්ඩකාරී ගෝලීය භූ දර්ශනය තුළ, ශ්‍රී ලංකාවට ඉගෙන ගත යුතු පාඩම් තිබිය හැකි අතර, ලෝකයටද ශ්‍රී ලංකාවෙන් ඉගෙන ගත හැකි පාඩම් තිබිය හැක.

මෙම සුන්දර දිවයින දශක ගණනාවක් පුරා පැවති බෙදුම්වාදී ක්‍රියාකාරකම් හා ප්‍රචණ්ඩත්වයෙන් පසු සුවය ලබමින් සිටින අතර, දැන් බරපතල ආර්ථික අර්බුදයකටද මුහුණ දෙමින් සිටී.

ශ්‍රී ලංකාව යනු මානව විභවයන්ගෙන් පිරුණු රටකි. බොහෝදුෂ්කරතා මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාව සිය ප්‍රජාතාන්ත්‍රවාදී ක්‍රමය තුළ ශක්තිමත්ව පැවතීමට

කටයුතු කරමින් සිටී. සමට නිදහස් අධ්‍යාපනය ලබාදීම සඳහා සිදුකළ ආයෝජනය, අනාගතයට වඩාදායී තරුණ පරම්පරාවක් නිර්මාණය කරමින් සිටියි.

නමුත් මේ වන විට ශ්‍රී ලංකාව අභියෝග දෙකකට මුහුණ දී තර්ජනයට ලක් වී ඇත. **ඒවානම්: දණ්ඩනයෙන් මුක්ත වීම සහ අසමානතාවයි.**

මෙම අභියෝග සඳහා පිළියම් සෙවීම ශ්‍රී ලාංකිකයන් සතු වගකීමයි. එම ගමනට ඔබව දිරිමත් කිරීම සඳහා මම පැමිණ සිටිමි. එසේ ම, මෙම අභියෝග ජය ගැනීමට සහ අතීත බෙදීම් පසු කර යාමට මානව හිමිකම් විසඳුම් ලබාදීය මඟ බව අද රාත්‍රියේ විශේෂයෙන් අවධාරණය කිරීමට මම කැමැත්තෙමි.

ප්‍රථමයෙන්, **දණ්ඩනයෙන් මුක්ත වීම**

බෙහෙවින්ම වසර ගණනාවක් තිස්සේ යුද්ධ, අභ්‍යන්තර ගැටුම් හෝ විප්‍රකෝපනය අත්විඳ ඇත. ඇතැමුන් සබැඳියක් ගොඩනගාගැනීමට සමත් වී තිබේ. ප්‍රචණ්ඩත්වයෙන් හා බෙදුම්වැදී බවෙන් ඉරාදමාගැටුම් වලින් බිඳ වැටුණු සමාජයක සිට, ඔවුන් ගෞරවය පදනම් කරගත් සාමකාමී ක්‍රම මගින් ගැටලු විසඳීම සහ ඇතුළත් කිරීම හරහා සහජීවනය රැක ගන්නා සමාජ ගිවිසුමකට එළඹ ඇත.

උතුරු අයර්ලන්තය, ගැම්බියාව, ටිමෝර් ලෙස්ටේ, ලයිබීරියාව, සියරාලියෝන් සහ කොලොම්බියාව යන රටවල ප්‍රයත්නයන් මෑත කාලීන උදාහරණ කිහිපයක් ලෙස උපුටා දැක්විය හැකිය. නමුත් ඔබට දකුණු අප්‍රිකාව බිහිසුණු වර්ණභේදවාදී පාලනය ජයගත් ආකාරය ද සළකිල්ලට ගත හැකිය.

විත්දිතයන් සහ ඔවුන්ගේ පවුල්වල හඬට සහ අයිතිවාසිකම්වලට ස්ථිර හා නොසැලෙන අවධානයක් ලබාදීම, මෙම කර්තව්‍යය ඵලදායීව සිදු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ. **සත්‍ය සෙවීමේ කොමිෂන් සභා** සහ **අනුස්මරණය කිරීමේ අවස්ථාව ලබාදීම**, මෙන්ම **විත්දිතයන්ට වන්දි ගෙවීම** ද අනිවාර්යයෙන් සිදුකළ යුතු අතර, ඒවා සංක්‍රාන්ති යුක්තිය සඳහා ප්‍රධාන සාධක වේ. නමුත් **දරුණු අපරාධවලට වගකිව යුතු වරදිකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම ද** අනිවාර්යයෙන්ම සිදු කළ යුතු වේ.

මෙසේ සිදු කිරීම, යුක්තිය ඉටුකිරීම සඳහා වැදගත් වේ. හානිය වළක්වීම වැදගත් වේ.

සිතගත නොහැකි වේදනාවක් සහ පඬුවක් විඳ දරගනිමින් ජීවත්වන වින්දිතයින් සඳහා වැදගත් වේ.

අනාගතයට වැදගත් වේ.

ජනීන් සහ ජීවිත සුනුවිසුනු කරමින් නැවත නැවතත් පැන නගින ප්‍රචණ්ඩත්ව චක්‍රය අවසන් කිරීමට සහ ප්‍රජාවන් සහ අසල්වැසියන් අතර පෙදු ඉරණමක් පිළිබඳ හැඟීමක් ලබාදී ඔවුන් නැවත එකට එකතු කිරීම සඳහා, සිදුවී ඇති දෙය පිළිබඳ සත්‍යය දැනගත යුතු අතර, යුක්තිය ඉටු වන බවට පෙදු විශ්වාසයක් ද ඔවුනතර තිබිය යුතු

ඔස්ට්‍රියානු ජනිකයෙකු ලෙස, සංකාන්ත්‍රි යුක්තියේ අභියෝග මම හෙළින් තේරුම් ගෙන සිටිමි. කුඩාකල, අප ඔස්ට්‍රියානුවන් නාසිවරුන්ගේ පළමු ගෙදුර බවට පත්වූ බව මම බොහෝවිට අසාඇත්තෙමි: එය සැනසිලිදායක බොරුවක්.

පුළුල් ලෙස කිවහොත්, 1980 දශකයේදී — නාසීන්ගේ නැගීමෙන් වසර 50ක කලයක් ගත වීමෙන් පසු පමණයි — මගේ රටේ ජනතාවට අවසානයේ සත්‍යයට මුහුණ දීමට හැකි වුනේ. එනම් ඔස්ට්‍රියානු ජනතාව ද බිහිසුණු අපරාධ සිදු කර ඇති බව සහ එම අපරාධ වලට වගවීමක් සිදුවිය යුතු බවයි.

සමූල ඝාතන, ත්‍රස්තවාදය, බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්, වධහිංසා පමිණවීම හෝලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ යථාර්ථයට එකඟ වීම ඉතාවේදනාකාරී ක්‍රියාවලියක් බව මම දනිමි.

නමුත් වින්දිතයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සිදු කරන ලද අපරාධ පිළිබඳ පිළිගැනීමක් නොමැති වීම හේතුවෙන්, ගැටුම් සහ වෛරය තවදුරටත් වර්ධනය වනු ඇත.

දණ්ඩණයෙන් මුක්ත වීම තවදුරටත් මුල් බැස ගනී .

මිනිසුන් සාහසික අපරාධ ප්‍රතික්ෂේප කිරීම හෝ යුක්තිගත කිරීම සඳහා සංශෝධනවාදී ආඛ්‍යාන නිර්මාණය කරමින්, වගකිව යුත්තන් පවාඋත්කර්ෂයට නංවනු ඇත.

කිසිදු ප්‍රතිඵලයක් අත්කර නොදෙන, නිර්දේශ කිසි විටෙකත් ක්‍රියාත්මක නොකරෙන කොමිෂන් සභාසහ විමර්ශන තුළින්, මහජන විශ්වාසය පළුදු කරන අතර වින්දිතයින්ට වඩාත් වඩි වේදනාවක් ඇති කරනු ලබයි.

මේ කාරණය අවධාරණය කිරීම අවශ්‍යය යැයි සිතමි: **යුක්තිය ඉටු නොවීම, සමයේ ස්ථාවරත්වය හානි කරයි.**

අනෙක් අතට, සත්‍යය පැවසීම තුළින් යුක්තිය ඉටු කිරීමට සහ වන්දි ලබාදීම සඳහාඉඩ ප්‍රස්ථාව සැලසෙන අතර - අවසානයේ දී එය මිනිසුන් සුවපත් කිරීමට ද උපකාරී වේ.

ජනතාවට සිදු වූ අනිතික කටයුතු පිළිබඳ සත්‍යය සම්පූර්ණයෙන් පිළිගැනීම ඇතුළුව වගවීම සහ යුක්තිය, කල් පවතින සමය සහ සංහිඳියාව කරායන මාවත ගොඩනැගීමට උපකාරී වේ.

මෙය අන්තර්ග්‍රාහී ආර්ථික වර්ධනයටත් සහ තිරසර සංවර්ධනයටත් අත්‍යවශ්‍ය වේ. ඒ නිසාඅපට එක් කාරණාවක් අනෙකෙන් වෙන් කළ නොහැක.

සම්භාවනීය ආරාධිත අමුත්තනි, ආදරණීය මිත්‍රවරුනි,

මම දෙවන අභියෝගය දෙසට හැරෙන්නම්: **අසමානතාව සහ ආර්ථික දුක්ඛිතබාවය** සමාජ බෙදීම් සහ ප්‍රචණ්ඩත්වය සමඟ ඉතාගැඹුරින් බැඳී ඇත.

බොහෝඅවස්ථාවලදී, එක්සත් ජනීන් වෙත ඉදිරිපත්වන අර්බුදවල මූලාරම්භක හේතු විශ්ලේෂණය කිරීමේදී අපට පැහැදිලිව පෙනෙන්නේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් එකිනෙකට බැඳී උල්ලංඝනය වීමයි.

ඔවුන්ගෙන් බොහෝදෙනෙකුට පෙදෙ ගැටළුව වී ඇත්තේ, දරාගත නොහැකි ආර්ථික දුක්ඛිතභාවය වන අතර එමඟින් මිනිසුන් හුදෙකලාවීම සිදුවන අතර, ඔවුන් ව නොසලකාහැර ඇත යන හැඟීම ඇතිවීම හේතුවෙන්, ඔවුන් තුළ අවිශ්වාසය වඩි වේ.

ගැටුම් සහ බෙදීම්, අනෙක් අතට, ආර්ථික බිඳවැටීම වඩාත් තීව්‍ර කරන අතර, විශ්වාසය තවදුරටත් පළුදු කිරීමට සහ දූෂණයට හා‍වංචාවට ඇති අවස්ථා නිර්මාණය කරයි.

එහෙත් රාජ්‍යයන්ට අසමානතාවලට **පෑදුක වන වෙනස් කොට සලකීම් තුරන් කළ හැකිය.** ආර්ථික වර්ධනය, අධ්‍යාපනික ජයග්‍රහණ සහ සමෘද්ධිය යන අංශවලින් සෑම කෙනෙකුටම විශාල ධනාත්මක බලපෑමක් ඇති කරමින් බොහෝ රටවල් මේ සඳහා‍වෙදගත් පියවර රැසක් ගෙන ඇත.

ආර්ථිකයට සහ ව්‍යාපාරවලට අදාළ සියලු ප්‍රතිපත්ති සඳහා‍මානව හිමිකම් කේන්ද්‍රීය කළ හැකිය - ගුණාත්මක අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා‍සඳහා‍ප්‍රාථමිකත්වය ඇති ප්‍රවේශය පුළුල් කිරීම; විශ්වීය සමාජ ආරක්ෂාව; යහපත් රැකියා උත්පාදනය; ආහාර, පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ නිවාස; සහ පිරිසිදු, සෞඛ්‍ය සම්පන්න සහ තිරසර පරිසරයක් සඳහා‍ආයෝජනය කිරීම යනාදිය මේ යටතේ දැක්විය හැක.

මෙම අයිතිවාසිකම් යහපත් ආර්ථිකයක් සහ සෞඛ්‍යසම්පන්න සමාජයන් ගොඩනැඟීමට මඟ පෑදුයි. වෙනස් වන ආර්ථිකය තුළ, අන්ත දරිද්‍රතාවයෙන් ජනතාව ආරක්ෂාකළ හැකි සහ තාවකාලික ව ඇතිවන අභියෝග මඟහරවාගැනීමට උපකාර කළ හැකි තීරණාත්මක සහයෝගයක් ඔවුන්ට ලබාදිය හැකිය.

එපමණක් නොව, බොහෝ‍සංවර්ධනය වෙමින් පවතින රටවල් පෙන්වාදී ඇති පරිදි, මෙම අයිතිවාසිකම් **දීර්ඝ හැකි මිලකට** ලබාදිය හැක. සියලුම ළමුන් සඳහා මුදල් දීමනා, අලුත උපන් බිළිඳුන් සිටින නව මව්වරුන් සඳහා‍මාතෘත්වලාභ ලබාදීම, දරුණු ආබාධ සහිත සියලුම පුද්ගලයින්ට අවශ්‍ය දීමනාලබාදීම, සහ වැඩිහිටි පුද්ගලයින්ට විශ්‍රාම වැටුප් ඇතුළු සමාජ ආරක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා, සංවර්ධනය වෙමින් පවතින රටවල සිය දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) සාමාන්‍යයෙන් 1.6%ක් පමණක් වැය වන බව ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) පෙන්වාදී ඇත. ඉදිරියේදී පැවැත්වෙන ලෝක සමාජ සමුළුවේදී, මෙය සාකච්ඡාකෙරෙන කරුණක් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. තවද අපි කොවිඩ් වසංගතයෙන් පාඩම් ඉගෙන ගෙන ඇති බව ද නිසැකය.

මනව හිමිකම් ආර්ථිකයක මෙම අත්‍යවශ්‍ය අංග සමඟ සමගමීව, බෙහෝ රජයන් සිය මෙහෙයුම් සහ සැපයුම් දම හරහා මනව හිමිකම්වලට ගරු කරන බව සහතික කිරීම සඳහා ව්‍යාපෘතික කටයුතු නියමනය කිරීමට පියවර ගෙන ඇත.

මහජනතාවට සහ පෙදු යහපතට වෙන් කර ඇති මුදල් පුද්ගලික ප්‍රතිලාභ සහ ලාභ ප්‍රයෝජන සඳහා යෙදාගන්නේ නම් එවන් දූෂණයන්ට එරෙහිව සටන් කිරීමට ද ඔවුන් කටයුතු කර ඇත.

මෙම ක්ෂේත්‍රවල රජයන්ට උපකාර කිරීම සඳහා එක්සත් ජනීන්ගේ සංවිධානයට බෙහෝ වැඩසටහන් තිබේ.

ශ්‍රී ලංකාව ඇතුළු බෙහෝ රටවලට - මනව හිමිකම් සඳහා ආයෝජනය කිරීමට බාධාපමුණුවන අධික ණය බරින් රටවල් නිදහස් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල ගෙලීය ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය ද අවධාරණය කිරීමට කමුත්තෙමි.

සහෘදයනි, මිත්‍රවරුනි,

මනව ගරුත්වය, යුක්තිය සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මගේ කාර්යාලය වසර 21 ක් තිස්සේ ශ්‍රී ලංකාව තුළ කටයුතු කර ඇත.

සිවිල් යුද්ධය අවසන් වූ දාසිට, වෙනස් කොට සලකීමකින් තොරව, වඩාත් සාධාරණ සමාජයක් කරායන ප්‍රගතිය වෙනුවෙන් පෙනී සිටිමින් විනිවිද පෙනෙන, වගකිව යුතු ආයතන සහ තීරණ ගැනීමේදී සහ ජන ජීවිතයේ දී ජනතාවගේ අර්ථවත් සහභාගීත්වයක් සහිත සහයෝගයක් ලබාදී ඇත්තෙමු. බෙහෝ උල්ලංඝනය කිරීම්වලට හේතුපදක වූ ගැටළු සහගත නීති ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව ද උපදෙස් ලබාදී ඇත්තෙමු.

විවිධත්වයෙන් පිරිපුන් සමාජයක් සමෘද්ධිමත් වීමට ඇති අවස්ථාව අතිමහත්ය – එය වචනාර්ථයෙන් විවිධ භාෂාභාවිතය හෝ විවිධ අදහස් ප්‍රකාශ කිරීම ලෙස දැක්විය හැකිය. පුළුල්, නිදහස් පුරවැසි අවකාශයක් සහ ස්වාධීන මාධ්‍යයක් පවත්වාගෙන යම වරප්‍රසාදයක් පමණක් නොව, එය සෞඛ්‍ය සම්පන්න සහ ශක්තිමත් ආර්ථිකයන් හා ආයතන නිර්මාණය කිරීමේ ප්‍රධාන සාධක වේ.

ආර්ථික වර්ධනය සහ සමාජය ඇති කිරීම සහ පවත්වාගෙන යාමේ කර්තව්‍යය ඇතුළුව සමාජයේ සෑම අංශයකටම පාහේ **කාන්තාවන්ගේ පූර්ණ සහභාගීත්වය** අත්‍යවශ්‍ය වේ. එක් ප්‍රමුඛ ගෝලීය අධ්‍යයනයකින් හෙළි වූයේ, සෑම සම්මුතියක් පවත්වාගෙන යාමට කාන්තාවන්ගේ සක්‍රිය සහභාගීත්වය තිබීමෙන් වසර 15 කට අධික කාලයක් පැවති සමාජ ගිවිසුමක් ඇති වීමේ අවස්ථාව සියයට 35 කින් වැඩිවන බවයි.

ශ්‍රී ලංකාවේ සමාජය ගොඩනැඟීම,අධ්‍යාපනයේ සිට සෞඛ්‍යය දක්වා සහ පාර්ලිමේන්තු නියෝජනය ඇතුළු ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම කාන්තාවන්ට වැදගත් කාර්යභාරයක් පැවරිය යුතුය. වත්මන් පාර්ලිමේන්තුවට ඉහළ කෙරීමක් ඇති බව මම සැලකිල්ලට ගෙන ඇත. ඇත්ත වශයෙන්ම තවත් බොහෝදේ කළ හැකිය. එය මේ අයුරින් දිශාවක් ගැනීම යහපත්ය. අනිකුත් රටවල මෙන්, මෙහිදී ද, මාගේ කාර්යාලය කාන්තාවන්ගේ සහ ගැහැණු ළමුන්ගේ සමානාත්මතාවය සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට උපරිමයෙන් කටයුතු කරනු ඇත.

මෙරට තුළ වගවීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහාඅප අඛණ්ඩව කටයුතු කරමින් සිටිමු. අනාගත වගවීම් ක්‍රියාවලීන්ට සහාය විය හැකි තෙරතුරු අප විශ්ලේෂණය කර ඇති අතර, සංක්‍රාන්ති යුක්තියට අදාළ ප්‍රධාන මාර්ගෝපදේශයන් ලබාදී ඇත්තෙමු. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්වාධීන කාර්යභාරය ශක්තිමත් කිරීම සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පද්ධතිය සමඟ රජය සම්බන්ධ කර ගැනීම සඳහාද අපි නිරන්තර සහාය පළ කර ඇත්තෙමු. අප හා සමස්ත පද්ධතිය සමඟ ඇති සම්බන්ධය මම බොහෝ සෑදරයෙන් පිළිගනිමි.

මානව හිමිකම් යනු පිටත සිට එල්ල කරන අනාතුරුදායක හෙල්ලක් වැනි දෙයක් ලෙස ඇතැමුන් සිතති.

නමුත් මානව හිමිකම් යනු ඔබ ගැන, ශ්‍රී ලංකාවේ ජනතාව ගැන ය කතාකිරීමයි. ඔබේ ගැටළු, ඔබේ අයිතිවාසිකම්, ඔබේ නිදහස, ඔබේ ජීවිත ගැන සාකච්ඡාකිරීමයි

අපි මේ රටට කඩුපතක් ගේනවා සමහර විට එය ඔබට ප්‍රිය නෙවන රූපයක් පෙන්විය හැකි කඩුපතක් - සමාන්‍ය කඩුපතක් ආකාරයේ ම - නමුත් එය ඔබේ සබෑ ප්‍රතිබිම්බය පිළිබිඹු කරයි.

2022 අරගල විරෝධතාවලදී සියලු ප්‍රජාවන්ට සහ සියලු තරාතිරම්වල මිනිසුන් විශාල ප්‍රමාණයක් වීදි බැසීමට හේතු වූයේ නව, වඩාසාධාරණ, සමාජයක් සහ වඩාත් මානුෂීය සමාජ ක්‍රමයක් සඳහාවූ ශ්‍රී ලාංකිකයන්ගේ අභිලාෂයන් පෙරදැරි කරගෙන ය.

මෙම සතියේ දී මම රජයේ සමාජිකයින් සහ විවිධ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාපවත්වීමට තීරණය කර ඇත්තෙමි, මගේ කාර්යාල මට්ටමින් සහ පුළුල්ව එක්සත් ජනීන් හරහාසියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් රැකගැනීමට සහාය වීම සඳහාඅපගේ සහයෝගීතාව වඩාත් හොඳින් වර්ධනය කර ගත හැකි ආකාරය සහ අද සවස් භාගයේදී මාමතු කළ කරුණු කිහිපයක් ඉදිරියට ගෙන යාහැකි ක්‍රම සෙවීමට ද මම අපේක්ෂාකරමි.

මානව හිමිකම් ප්‍රවර්ධනය කරන සහ අසමානතාවයන් සහ දූෂණයට එරෙහිව සටන් කරන ආර්ථික නායකත්වයක් ප්‍රවර්ධනය කිරීම.

මූලික පුරවැසි නිදහස සඳහාපුළුල් අවකාශයක් ඇති කිරීම.

සහ සත්‍යය පැවසීම සහ වගවීම සහතික කිරීමේ දුෂ්කර නමුත් වැදගත් කාර්යය ඉටු කිරීමට අපේක්ෂාකරමි.

මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ගොදුරුවූවන්ට සහය දැක්වීමට සහ ඔවුන් ගෙරව කිරීමටත්, මෙම සුන්දර රාජ්‍යයේ ජනතාව අතර සංහිඳියාව ඇති කළ හැකි ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීමටත් අපේක්ෂාකරමි.

ශ්‍රී ලංකාව වැදගත් මොහොතකට පාමිණ ඇත. මෙය නව පරිච්ඡේදයක් සහ නව අවස්ථාවක් විය හැකිය. ජනතාව බලාපොරොත්තු සහගතව බලාසිටින අතර රජයේ සෑම මට්ටමකම නායකයින්ගෙන් ඔවුන් අව්‍යාජ කැපවීමක් අපේක්ෂා කරති.

ගෙලීය තර්ජන වඩිවෙමින් පවතින මේ යුගය තුළ, සමාජය, ප්‍රචණ්ඩත්වයට පිටුපා, ගෙණවය සහ සියලුදෙනාඇතුළත් සමෘද්ධිය හාසමය සහිත නව මඩතක් ගෙඩනගීමෙන් ලෝකයට ආදර්ශයක් වීමට මෙරටට හැකියඩ තිබේ.

ස්තුතියි!